සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය | **ක්‍රිස්තියානි ධර්මය I** | කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01 යුදයේ බෙත්ලෙහෙම් නම් දාවිත්ගේ නුවර දාවිත්ගේ පෙළපතින් කිතු උපත සිදුවීමෙන්,
(1) ජෙරමියා දිවැසිවරයාගේ අනාවැකිය සම්පූර්ණ වේ.
(2) යෙසායා දිවැසිවරයාගේ අනාවැකිය සම්පූර්ණ වේ.
(3) මීකා දිවැසිවරයාගේ අනාවැකිය සම්පූර්ණ වේ.
(4) සෙකරියා දිවැසිවරයාගේ අනාවැකිය සම්පූර්ණ වේ.

02 දෙවියන් වහන්සේ තෝරාගත් ජනතාව අතරින් අධිපතියෙක් පහළවන බව ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,
(1) අමෝස් ය. (2) ජෙරමියා ය. (3) මීකා ය. (4) යෙසායා ය.

03 ''මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නා වූ මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි.'' මෙහ සඳහන් පෙරටුව යන දූතයා වන්නේ,
(1) ස්නාවක ජොහාන්තුමා ය. (2) ජේසුස් වහන්සේ ය.
(3) පේදුරුතුමා ය. (4) පාවුල්තුමා ය.

04 ජේසුස් වහන්සේගේ උපත සිදුවන කාලයේ ජුදෙව් සමාජය පුරා පැවතුනේ,
(1) සාමය හා සංහිඳියාව යි. (2) ප්‍රේමය හා ප්‍රීතිය යි.
(3) කඳුල හා වේදනාව යි. (4) දූෂණය හා වංචාව යි.

05 ස්නාවක ජොහන්තුමා බොහෝ දෙනෙකු ස්වාමින්වහන්සේ වෙත හරවනු ලැබුවේ,
(1) සුබාරංචිය දේශනා කරමිනි. (2) පව් කමාව ලබා දෙමිනි.
(3) මනස්ථාපනයේ බව්තීස්මය ලබා දෙමිනි. (4) දිවැස් වැකි ප්‍රකාශ කරමිනි.

06 දේවදූත පණිවිඩය ලද ජෝසෙප්තුමාගේ ප්‍රතිචාරය වූයේ,
(1) මරියාණන් තම බිරිඳ ලෙස තම නිවසට කැඳවාගෙන යාම ය.
(2) මරියාණන්ගෙන් වෙන්වී යාමට තීරණය කිරීම ය.
(3) මරියාණන්ගෙන් සැඟවී සිටීමට තීරණය කිරීම ය.
(4) මරියාණන්ගේ නිවසේ පදිංචි වීමට පිටත්ව යාම ය.

07 ඇදහිල්ලෙන් හා විශ්වාසයෙන් කළ දේව කන්නලව්වේ ප්‍රථිඵලය වන්නේ,
(1) සෙකරියස්ට දේව මාළිගාවේ සුවඳදුම් ඔප්පු කිරීමේ වරය ලැබීම ය.
(2) සෙකරියස්ට කථා කිරීමට නොහැකිව ගොළු වීම ය.
(3) ගොළු වූ සෙකරියස් ට නැවත කථා කිරීමට හැකියාව ලැබීම ය.
(4) මහළු වයසේ දී ස්නාවක ජොහාන්ගේ උපත සිදුවීම ය.

08 ව්‍යවස්ථාව තම වාසියට අර්ථ කථනය කරමින් ආගමික වශයෙන් ජනතාව පීඩාවට පත් කළේ,
(1) පරිසිවරු හා අයකැමියන් ය. (2) පරිසිවරු හා සද්දුසිවරුන්ට ය.
(3) අයකැමියන් හා සද්දුසිවරුන් ය. (4) අයකැමියන් හා විනයධරුන් ය.

09 සිමියොන් මරණයට පෙර දකින බවට අනාවරණය ලැබ තිබුනේ,

(1) මෙසියස් වහන්සේ ය. (2) දෙවියන් වහන්සේ ය.

(3) පෙරමග දූතයන් ය. (4) මැවුම්කාරයාණන් ය.

10 ස්නාවක ජොහාන්තුමාගේ පණිවිඩය ලැබූ ජුදය ගලීලය ඉතුරය, ත්‍රිකෝණිය සහ අබ්ලේනය ප්‍රදේශ පාලන කරනු ලැබුවේ,

(1) රෝම අධිරාජ්‍යය ය. (2) ග්‍රීක අධිරාජ්‍යය ය.

(3) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ය. (4) ප්‍රංශ අධිරාජ්‍යය ය.

11 ''වෙදතුමාණෙනි ඔබම සුව කරගන්න'' ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කරනු ලැබුවේ,

(1) ජෙරුසෙලම් දේව මාළිගාවේදී ය. (2) නාසරෙත් සිනගෝගයේදී ය.

(3) සීමොන්ගේ ගෙදරදී ය. (4) සාකෙවුස්ගේ ගෙදරදී ය.

12 තම දුර්වල පාපී ස්වභාවය හඳුනාගෙන ජේසුස් වහන්සේ ඉදිරියේ වැඳ වැටුන සීමොන් ට උන්වහන්සේ දක්වූ ප්‍රතිචාර වූයේ,

(1) ''ඔබේ පව් ඔබට කමා කරනු ඇතැයි පැවසීම යි.

(2) ''ඔබ ගොස් පූජකයින් ඉදිරියේ පෙනී සිටින්නැයි පැවසීමයි.''

(3) ''මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇතැයි'' පැවසීම යි.

(4) ''මා ඔබට දියයුතු දේ ඉල්ලන්නට'' පැවසීමයි.

13 ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් අතර ධීවරයින් නොවන කණ්ඩය වන්නේ,

(1) මතෙව්, තෝමස්, පිලිප්, ජොහන් ය. (2) තෝමස්, පිලිප්, ඇන්ඩෘ, ජුදස් ය.

(3) මතෙව්, පිලිප්, ජුදස්, පේදුරු ය. (4) පිලිප්, ජුදස්, තෝමස්, බර්තෙලමෙව්ස් ය.

14 බෙතානියේ නිවසේදී ජේසුස් වහන්සේගේ අගය කිරීමට භාජනය වූයේ,

(1) මාර්තා ආගන්තුක සත්කාරයේ යෙදීමයි.

(2) මරියා දේව වචනය ඇසීමට යොමු වීමයි.

(3) මාර්තා මරියාට විරුද්ධව චෝදනා නැඟීමයි.

(4) මාර්තා සහ මරියා උන් වහන්සේ සිය නිවසට පිළිගැනීමයි.

15 වසර 18ක් අශුද්ධ බලවේගයකට යටත්ව කුදුව සිට ජේසුස් වහන්සේගෙන් සුවය ලැබූ ස්ත්‍රිය හඳුන්වනු ලැබුයේ,

(1) ආබ්‍රහම්ගේ දියණිය ලෙස ය. (2) දේව දියණිය ලෙස ය.

(3) පවුකාර ස්ත්‍රිය ලෙස ය. (4) ජූදා මාතාව ලෙස ය.

16 තම සහෝදර ජනතාව කෙරෙහි අනුකම්පා විරහිතව ක්‍රියා කළ අයකැමියන්,

(1) රෝම පාලකයින්ගේ හවුල්කරුවන් ලෙස සැලකූ හ.

(2) රෝම පුරවැසිභාවය ලැබූවන් ලෙස සැලකූ හ.

(3) දේශ ද්‍රෝහීන් හා පවුකරුවන් ලෙස සැලක හ.

(4) තම ජාතිය පාවා දෙන්නන් ලෙස සැලකූ හ.

17 දකුණේ සිටි ජුදෙව්වන් උතුරේ සිටි තම සහෝදර ජනතාවක් වූ සමාරිතානුවන් කොන් කරනු ලැබුයේ,

(1) උතුරු රාජ්‍යය දකුණු රාජ්‍යයෙන් වෙන්වීම නිසා ය.

(2) උතුරු ජනතාව අන්‍ය ජාතින් සමග මිශ්‍රවීම නිසාය.

(3) උතුරේ ජනතාව දැඩිලෙස පාපයට වැටී සිටි නිසාය.

(4) උතුරේ ලාදුරු වැනි දරුණු රෝග පැතිරී තිබීම නිසාය.

18 ජේසුස්වහන්සේ මිදිවත්ත හා ගොවීන් පිළිබඳ උපමාව වදාළේ,

(1) සද්දුසිවරු උපවාස කිරීම පිළිබඳ ප්‍රශ්න කිරීමෙන් අනතුරුව ය.

(2) සද්දුසිවරු පුණර්ජීවනය පිළිබඳ ප්‍රශ්න කිරීමෙන් අනතුරුව ය.

(3) පව් කමාව පිළිබඳ ප්‍රශ්න කිරීමෙන් අනතුරුව ය.

(4) අධිකාරි බලය පිළිබඳ ප්‍රශ්න කිරීමෙන් අනතුරුව ය.

19 ජේසුස් වහන්සේ රජකුසේ කොටළුවකු පිට ජෙරුසෙලමට පිවිසුනේ,

(1) තම සේවය ආරම්භ කිරීමට ය. (2) තම මරණයට මුහුණ දීමට ය.

(3) තම ශ්‍රාවකයින් තෝරා ගැනීමට ය. (4) තම රාජ්‍යය ආරම්භ කිරීමට ය.

20 දුක් වේදනාවලට මුහුණ දීමට යාච්ඤාව තුළින් ශක්තිය හා ධෛර්යය ලබාගත හැකි බවට අපට ලැබෙන ආදර්ශය වන්නේ,

(1) ජේසුස්වහන්සේගේ ඔලීව කන්දේ යාච්ඤාවයි.

(2) සෙකරියස්ගේ දේව මාලිගාවේ යාච්ඤාවයි.

(3) ස්නාවක ජොහන්ගේ පාළුකරයේ යාච්ඤාවයි.

(4) පාවුල්තුමාගේ පිලිප්පි සිරගෙදර යාච්ඤාවයි.

21 පිලාත් විසින් ජේසුස් වහන්සේ කුරුසිපත් කිරීමට නියෝගය ලබාදුන්නේ,

(1) උන්වහන්සේ වැරදි කරුවෙකු ලෙස ඔහු තීරණය කල නිසා ය.

(2) උන් වහන්සේට කළ චෝදනා ඔප්පු වූ නිසා ය.

(3) උන්වහන්සේ ඇණ ගසන්නයි ජනතාව උද්ඝෝෂණය කළ නිසා ය.

(4) උන්වහන්සේ පිළිබඳ පිලාත් තුළ තිබූ දැඩි වෛරය නිසා ය.

22 හෙරොද් රජු ජේසුස්වහන්සේ පිලාත් වෙත ආපසු යවනු ලැබුයේ,

(1) තීන්දුව දීමට හෙරොද්ට බලයක් නොතිබුණ නිසා ය.

(2) ජේසුස් වහන්සේ පිලාත්ගේ විනිශ්චය ඉල්ලූ නිසා ය.

(3) උන්වහන්සේ අත කිසිදු වරදක් නොදුටු නිසා ය.

(4) උන්වහන්සේ පිලාත්ගේ බල ප්‍රදේශයට අයත් වූ නිසා ය.

23 අපට පැමිණෙන් විවිධ පරීක්ෂාවන්ට හසු නොවී සිටීමට නම් අප,

(1) යාච්ඤාවෙන් හා ඇදහිල්ලෙන් ක්‍රියා කළ යුතු ය.

(2) නිතර දේවස්ථානයට යා යුතු ය.

(3) පූජකතුමාග් වැඩවලට උදවු කළ යුතු ය.

(4) පූජකතුමන් සමග කිට්ටු ඇසුරක් ගොඩනගාගත යුතු ය.

24 මිනිස් වර්ගයාට සදාකාලික ජීවනයට දොරටු විවරකරන නව බලාපොරොත්තුවේ ශුභාරාංචියක් වූයේ ජේසුස්වහන්සේගේ,

(1) උත්පත්තියයි. (2) උත්ථානයයි.

(3) කුරුසිපත්වීමයි. (4) බෞතීස්මයයි.

25 ජේසුස් වහන්සේගේ කුරුසිපත්වීම පරාජයක් නොව විජයග්‍රහණයක් බව පෙන්වීමට උන්වහන්සේ කළ ප්‍රකාශය වන්නේ,

(1) ''ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න.'' යනුයි.

(2) ''පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරන්න'' යනුයි.

(3) ''ඔබ අදම මා සමග පාරාදීසයේ සිටින්නෙහි ය.'' යනුයි.

(4) ''ජෙරුසලමේ දූවරුනි මා නිසා නොහඬන්න.'' යනුයි.

26 දේවරාජ්‍යයේ වර්ධනය පෙන්වීමට ජේසුස්වහන්සේ ප්‍රකාශ කළ උපමා කථා වන්නේ,

(1) නැතිවූ පුත්‍රයා හා නැතිවූ බැටළුවා පිළිබඳ උපමාව ය.

(2) වපුරන්නාගේ උපමාව හා මහා මංගල භෝජනය උපමාව ය.

(3) අබ ඇටය උපමාව හා මුහුණ පිළිබඳ උපමාව ය.

(4) අබ ඇටය උපමාව හා නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමාව ය.

27 ජේසුස් වහන්සේගේ දේශනාවල මූලික හරය වන්නේ,

(1) දේව රාජ්‍යයි. (2) කිතුණු ජීවිතයයි.

(3) මෙලොව ජීවිතයයි. (4) ජීවන මාර්ගයයි.

28 ජේසුස් වහන්සේ කුරිසිය මත අවසන් හුස්ම හෙලන අවස්ථාවේදී ප්‍රකාශ කරනු ලැබූයේ,

(1) ''ජෙරුසලමේ දූවරුනි මා නිසා නොහඬන්න.'' යන්නයි.

(2) ''පියාණෙනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාරදෙමි.'' යන්නයි.

(3) ''පියාණෙනි ඔවුනට කමා වුව මැනව.'' යන්නයි.

(4) ''ඔවුන් කරන දෙය ඔවුන් නොදනිති.'' යන්නයි.

29 ජේසුස් වහන්සේ ................................ පිළිබඳ ශුභාරංචිය ඔවුනට නව බලාපොරොත්තුවක් ගෙන දෙන්නාක විය. මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,

(1) දේශනාව ය. (2) එම්මාවුස් ගමන ය.

(3) කුරුසිපත් වීම ය. (4) පුණර්ජීවණය ය.

30 ජේසුස් වහන්සේ අපගේ ජීවිතවල පෞද්ගලිකව අත්දැකීමට නම් අප,

(1) පාපයෙන් මිදී ඇදහිල්ල වර්ධනය කරගත යුතු ය.

(2) සෑම ඉරිදා දිනකම දේවස්ථානයට යා යුතු ය.

(3) දේව නමස්කාරයට සහභාගී විය යුතු ය.

(4) ජේසුස් වහන්සේ ජීවමාන බව අන් අයට ප්‍රකාශ කළ යුතු ය.

31 කිතුණුවන් වන අප බෞතීස්මය ලැබීම මගින්,

(1) මනස්ථාපනයට යොමු වූයේමු ය. (2) සදාතන ජීවනය ලබාගන්නෙමු ය.

(3) ශුද්ධාත්ම අනුහසට විවෘත වූයෙමු ය. (4) දේව දරුවන් බවට පත් වූයෙමු ය.

32 ජේසුස් වහන්සේට පරීක්ෂා පැමිණි අවස්ථාවේදී ඒවාට පිළිතුරු දුන් දේව වචනය අඩංගු ග්‍රන්ථය වන්නේ,

(1) උත්පත්ති ය. (2) ද්වීතිය නීති සංග්‍රහය ය.

(3) නික්මයාම ය. (4) ගණන් කථාවය ය.

33 ජේසුස් වහන්සේගේ ජීවිතයේ ඉතා වැදගත් සිද්ධියක් වන සත්‍යතාවයේ ආලෝකයාගෙන් අනාවරණය වූ අවස්ථාවක් වන්නේ,

(1) චර්ම ඡේදනයයි. (2) කැප කිරීම යි.

(3) බෞතීස්මය යි. (4) රූප විපර්යාසය යි.

34 ''ඔබ දෙවියන්වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය ය.'' මෙසේ ප්‍රකාශ කරනු ලැබුයේ,

(1) පාවුල්තුමා විසින් ය. (2) පේදුරුතුමා විසින් ය.

(3) මතෙව්තුමා විසින් ය. (4) ජොහන්තුමා විසින් ය.

35 අබ ඇටයේ උපමාවෙන් අබ ඇටය මගින් සංකේතවත් කරනු ලැබුයේ,

(1) දේව රාජ්‍යය සීඝ්‍රයෙන් වර්ධනය වන බව ය.

(2) අබ ඇටය විශාල ගසක් වන බව ය.

(3) අබ ගස කුරුල්ලන්ට සෙවන සදන බවය.

(4) දේව රාජ්‍යය ඉතා සුළුවෙන් ආරම්භ වන බවයි.

36 දේව රාජ්‍යයේ වර්ධනය අත්දැකීම සඳහා ඔබ විසින් කළ යුතු ක්‍රියාවන් කිහිපයක් පහත දැක්වේ.

A - ජේසුස්වහන්සේගේ දැක්ම තමා තුළ පවත්වා ගැනීම.

B - නොකඩවා යාච්ඤාවෙන්, ඇදහිල්ලෙන් දේව කැමැත්ත සෙවීම.

C - තමාට රිසි පරිදි සමාජයේ ජීවත් වීම.

D - ජේසුස්වහන්සේගේ අධිකාරීත්වයට හා රාජකීයත්වයට නතුවීම.

මින් ඔබ ඉටුකළ යුතු වන්නේ,

(1) A, B, C ය. (2) B, C, D ය. (3) A, B, D ය. (4) A, C, D ය.

37 ''මුළු ඊශ්‍රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත.'' යනුවෙන් ජේසුස්වහන්සේ ප්‍රකාශ කළේ,

(1) විජාතික ශතාධිපතියාගේ දාසයා සුවපත් කළ අවස්ථාවේදී ය.

(2) මහලේ රෝගී ස්ත්‍රිය සුවය ලැබූ අවස්ථාවේදී ය.

(3) අංශභාග රෝගියා සුවපත් කළ අවස්ථාවේදී ය.

(4) ලාදුරු රෝගියා සුවපත් කළ අවස්ථාවේදී ය.

38 'දාවිත්ගේ පුත්‍රයාණෙනි මට අනුකම්පා කළ මැනව'' යනුවෙන් සුවය අයදිනු ලැබුයේ,

(1) ජෙරිකෝවේ අන්ධ මිනිසා විසින් ය. (2) කුදු ස්ත්‍රිය විසින් ය.

(3) ගෙනසරත්හි අශුද්ධාත්ම මිනිසා විසින් ය. (4) කොර මිනිසා විසින් ය.

39 ''කිතුණු අපගේ දිවියට ආලෝකය වන්නේ,

(1) දිවැසි වැකි ය. (2) උපමා කථාවන් ය.

(3) දෙව් වදන් ය. (4) යාච්ඤාවන් ය.

40 කිතුණු ජීවිතයේ අභ්‍යන්තරික අගයන් කෙලෙස විය යුතුද යන්න පැහැදිලි කිරීමට ජේසුතුමා වදාල උපමා කථාව වූයේ,

(1) අබ ඇටය පිළිබඳව ය. (2) අත්තිවාරම් දෙක පිළිබඳව ය.

(3) මුහුන් පිළිබඳව ය. (4) පොළවේ ලුණු පිළිබඳව ය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **ක්‍රිස්තියානි ධර්මය II** කාලය පැය 2 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (1) ජේසුස්වහන්සේ මංගගතවීමේ අරමුණු දෙකක් ලියා දක්වන්න.

(2) දේවදූත පණිවිඩයට අවනත වෙමින් මරියතුමිය කළ ප්‍රකාශය ලියා දක්වන්න.

(3) ජේසුස්වහන්සේගේ උපතෙහි විශේෂත්වය දක්වන සංකේතාත්මක සංසිද්ධීන් දෙක ලියා දක්වන්න.

(4) අන්‍ය ජාතීන් සඳහා දේවරාජ්‍යය විවෘතව පවතින බව පෙන්වීමට නාසරෙත්හිදී ජේසුස් වහන්සේ තෝරාගත් උදාහරණ දෙක පෙන්වා දෙන්න.

(5) දේව රාජ්‍ය තුළ දක්නට ලැබෙන ලක්‍ෂණ දෙකක් ලියා දක්වන්න.

(6) දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්යයන් වර්ග කළ හැකි කාණ්ඩ මොනවා ද?

(7) ජේසුස්වහන්සේ සේවක නායකත්වය ආදර්ශයෙන් දැක්වූ අවස්ථා දෙකක් ලියා දක්වන්න.

(8) දේව රාජ්‍යයේ පුරවැසි භාවය පතා ගමන් කරන අය තම ජීවිතවල මුහුණදෙන අභියෝග දෙකක් පෙන්වා දෙන්න.

(9) පෞද්ගලික අවශ්‍යතා ගැන කරදර වීමේ නිෂ්ඵල බව පෙන්වීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ සංකේත වන්නේ මොනවාදැයි පෙන්වා දෙන්න.

(10) දූන් සාගිනි ඇති ඔබ භාග්‍යවන්තයෝ ය ... මෙම වදනින් ඔබට අවධාරණය කරුණු දෙකක් ලියා දක්වන්න.

02 (1) ජේසුස් වහන්සේගේ කාලයේ ජුදා සමාජයේ පැවැති චාරිත්‍ර දෙකක් ලියා දක්වන්න.

(2) එම චාරිත්‍ර විධියන් පැවැත්වීමට මූලික පසුබිම පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(3) වත්මන් ශ්‍රී ලාංකීය සමාජය තුළ පවත්වන චාරිත්‍ර නම්කර කිතුණු අනන්‍යතාවය ආරක්ෂා කරමින් ඒවා පවත්වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

03 (1) ස්නාවක ජොහන්තුමා වෙත පැමිණි ජන කණ්ඩායම් හතර නම් කරන්න.

(2) ස්නාවක ජොහන්තුමා එම ජන කණ්ඩායම් තුනකට දුන් උපදෙස් ලියා දක්වන්න.

(3) අද දවසේ ස්නාවක ජොහන්තුමා පැමිණියහොත් කුමන අයට කෙබඳු පණිවිඩයක් ලබා දේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

04 (1) දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති අපේක්ෂණ පෙන්වාදෙන උපමා කථා දෙකක් නම් කරන්න.

(2) නැතිවූ බැටළුවා පිළිබඳ උපමාවෙන් අවධාරණය කරනු ලබන ජේසුස් වහන්සේගේ ගුණාංග තුනක් පෙන්වා දෙන්න.

(3) මහා මංගල භෝජනය උපමා කථාවෙන් ඔබට ඒත්තු ගන්වන සත්‍යතා පහක් පෙන්වා දෙන්න.

05 (1) දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ නායකත්ව ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

(2) දේව රාජ්‍යයේ නායකත්වය දැරීම පිළිබඳ ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට දුන් උපදේ මොනවාදැයි පෙන්වා දෙන්න.

(3) දේවරාජ්‍යයේ පුරවැසියෙකු ලෙස ඔබගේ ජීවිතයේ වර්ධණය කරගත යුතු චරිත ලක්ෂණ වාක්‍ය පහකින් ඉදිරිපත් කරන්න.

06 (1) දේවරාජ්‍යයේ තීරණාත්මක මොහොත වශයෙන් ඔබ හඳුනා ගන්නේ කුමක්ද?

(2) දේවරාජ්‍යයේ තීරණාත්මක ක්‍රිස්තුස් වහන්සේ නැවත පැමිණෙන මොහොත තෙක් ක්‍රියා කළ යුත්තේ කෙසේද?

(3) ඔබගේ ජීවිතයේ පදනම ''අත්තිවාරම් දෙක'' උපමා කථාව ආශ්‍රයෙන් ඉදිරිපත් කරන්න.

07 කෙටි සටහන් ලියන්න.

(1) බෞතීස්මය

(2) මුල් ගෝලයින් කැඳවීම

(3) කමාව දීම

(4) පේදුරුගේ අපලාපය

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 3 ) | 03. ( 1 ) | 04. ( 4 ) | 05. ( 3 ) | 06. ( 1 ) | 07. ( 4 ) | 08. ( 2 ) | 09. ( 1 ) | 10. ( 1 ) |
| 11. ( 2 ) | 12. ( 3 ) | 13. ( 4 ) | 14. ( 2 ) | 15. ( 1 ) | 16. ( 3 ) | 17. ( 2 ) | 18. ( 4 ) | 19. ( 2 ) | 20. ( 1 ) |
| 21. ( 3 ) | 22. ( 3 ) | 23. ( 1 ) | 24. ( 2 ) | 25. ( 4 ) | 26. ( 3 ) | 27. ( 1 ) | 28. ( 2 ) | 29. ( 4 ) | 30. ( 1 ) |
| 31. ( 3 ) | 32. ( 2 ) | 33. ( 4 ) | 34. ( 2 ) | 35. ( 4 ) | 36. ( 3 ) | 37. ( 1 ) | 38. ( 1 ) | 39. ( 3 ) | 40. ( 4 ) |

(ල. 40)

## II පත්‍රය

(01) (1)
- දිළින්දන්ට සුභ අස්න දෙසීම
- බිඳුනු සිත් ඇත්තන්ටසුව සෙත දීම
- වහලුන්ට මිදීම දානය කිරීම.
- සිරකරුවන්ට නිදහ ලබාදීම.

(2) ''බලන්න මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවූ ලෙසම මට වේවා.''

(3) පායනලද සුවිශේෂී තාරකාවක්, එහි මග පෙන්වීම ඔස්සේ පෙරදිගින් පැමිණි ශුස්ත්‍රවන්තයින් පුදන ලද රන් තුවරලා ගන්ධ රසය.

(4) එළියා දිවැසිවරයාගේ කාලයේ ශාරපත්හි වැන්දඹුව එලිෂාගේ කාලයේ සිරියාවේ නාමන්

(5)
- අධිපත්‍ය හා බලය දෙවියන් වහන්සේ සතු ය.

රාජකීයත්වය හා නායකත්වය දෙවියන්වහන්සේ දරන සේක.
ජාති භේද වර්ණ භේද නැත, නිශ්චිත භූමි සීමාවක් නැත.
ප්‍රේමයේ පදනම මත සිදුකල උන්වහන්ගේ ඉගැන්වීම් (මින් කරුණු දෙකක්)

(6) සුවකිරීම්, අශුද්ධාත්ම දුරුකිරීම
ස්වභාවධර්මය අභිබවා කල ක්‍රියාවන්, මරණින් උත්ථාන කිරීම්

(7)
- කුඩා දරුවන් අගය කිරීම
- ශ්‍රාවකයන්ගේ පාද සේදීම.
- බොහෝ දෙනෙකුගේ මිදීම පිණිස නිහතමානීව සිය ජීවිතය පිදීම.

(8) කැඳවීමේ අභියෝගය — ප්‍රතිචාර දැක්වීමේ හයියෝගය
නිහතමානීකමේ අභියෝගය
වස්තුව ඇතුළු ලෞකික සම්පත්වලට ඇළුම් නොකිරීම. (මින් දෙකක්)

(9) කෙතේ මානෙල්, අහසේ පක්ෂීන්

(10) ආත්මික වුවමනාවට ඇති සාගින්න.
යහපත් ජීවිත පැවැත්මකට ඇති වුවමනාව

02 (1) චර්මච්ඡේදනය, කැප කිරීම, අවු: 12 දේව මාලිගාවට යෑම.

(2) චර්මච්ඡේදනය - ආබ්‍රහම්ගේ පැවතෙන දෙවියන්වහන්සේට සන්තක වීම.
කැප කිරීම - මිසරයේ වහල් බවින් කිදහස් වීම., ඉශ්‍රායෙල් කුළුදුලන් ආරක්‍ෂා වීම.
අවු: 12 දේව මාලිගාවට යාම - ඉශ්‍රායෙල් පිරිමි දරුවන් අවු: 12 සම්පූර්ණ වූ විට වැඩිහිටියන් ලෙස පිළිගැනීම, ටෝරාව ඉගැන්වීමට අවස්ථාව උදාවීම.

(3) සංහල අවුරුදු චාරිත්‍ර, ඉඳුල්කට ගෑම, මුල්ගල් තැබීම, ගෙට ගෙවදීම, අකුරු කියවීම, විවාහ මංගල උත්සව අවස්ථාවදී යාච්ඤාවෙන් දෙවිඳුන්ට භාරවීම විස්තර කර තිබීම.

03 (1) පොදු ජනතාව, රාජ්‍ය සේවයේ යෙදී සිටි අය, ආරක්‍ෂක අංශය, ජුදා ආගමික ජනතාව

(2) අඳනා දෙකක් ඇති අය නැති අයට දෙන්න.
කෑම ඇති අය නැති අයට දෙන්න.
නියමිත පමණට වඩා අය බදු අය නොකරන්න.
කිසිවකුගෙන් බලහත්කාරයෙන් කිසිවක් පැහැර නොගන්න.

(3) දේශපාලඥයින්, ආගමික නායකයින්, ගුරුවරුන්, සාමාන්‍ය ජනතාවට වංචාව, දූෂණය, අල්ලස් දීම ලියා තිබීම.

04 (1) මහමංගල භෝජනය, නැතිවූ කාසිය, නැතිවූ බැටළුවා, නැතිවූ පුත්‍රයා

(2) සමාජයේ නොමග යන්නන් පිළිගැනීම
වැරදි කරන්නන් උදෙසා දයාව කරුණාව දැක්වීම
වැරදි කරන්නන් මනස්ථාපනයට යොමු කිරීම.

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(3)
- දේව රාජ්‍යය සියලු දෙනාට විවෘත බව
- දෙවියන් වහන්සේගේ තීරණ අනුව දේව රාජ්‍යය සම්පූර්ණත්වයට පැමිණෙන බව
- දේව රාජ්‍යයට කැඳවීම දෙවියන් වහන්සේම කරන බව
- දෙවියන් වහන්සේගේ ආරාධනා ප්‍රතික්ෂේප කරන අයට සදාකාලිකව දේවරාජ්‍යය අහිමිවන බව
- දේව රාජ්‍යයේ කැඳවීම ලැබූවන් ධර්මිෂ්ඨකමින් හා ගැළවීමෙන් සැරසී සිටිය යුතු බව

05 (1)
- සාමකාමීව සහයෝගයෙන් කටයුතු කරයි.
- ප්‍රේමයේ ආධිපත්‍යය ලබයි.
- නායකයා යටත් අයට සේවය කිරීමට බැඳී සිටියි.
- යටත් අය සේවය ලබයි.

(2)
- ශ්‍රේෂ්ඨ තැනැත්තා ඉතා සුළු තැනැතතා වේ.
- නායකයා සේවකයා විය යුතු ය.
- අන් අය කෙරෙහි බලය පෑමට අවසර නැත.

(3)
- ජේසුස් වහන්සේට ප්‍රසන්න වන අයුරින් මුළු හදවතින් කැප වී සේවය කිරීම.
- නිහතමානීව දේව රාජ්‍යය උදෙසා වැයවීම.
- තමා ලැබූ විවිධ හැකියා අන් අයගේ යහපත සඳහා යොදමින් ක්‍රියා කිරීම.
- දේව කැඳවීමට නිසි ප්‍රතිචාර දැක්වීම.
- ජේසුස්වහන්සේ ප්‍රසන්න වන ලෙස මුළු හදවතින් කැප වී සේවය කිරීම.

(වැනි ලියා ඇති පිළිතතුරුවලට ලකුණු දෙන්න.)

06 (1) ජේසුස්වහන්සේගේ නැවත පැමිණීමයි.

(2)
- නිරතුරුවම සූදානමින් විශ්වාසදායක හා වගකීමෙන් යුත් සේවයක් ඉටු කළ යුතුය.
- සැබෑ ලෙස අවංකව මනස්ථාපනය විය යුතු ය.
- නිරතුරුවම ජේසුස්වහන්සේ සමඟ ගැඹුරු සපඳතාවයකට ඇතුළත් විය යුතු ය.

(3) තමාගේ ජීවිතයට හොඳ අඩිතාලමක් දමා ගැනීම එනම් දේව වචනය නැමති අඩිතාලම අත්‍යවශ්‍ය බව තේරුම් ගැනීම. ආශ්‍රිතව ලියා ඇති පිළිතුරු

07 (1) බෞතිස්ම - මගින් ශුද්ධාත්මඅනුහසට ඇතුල්වීම, ස්නාවක ජොහන් බෞතීස්ම කිරීම, ජේසුස්වහන්සේ බෞතීස්මය ලැබීම කිතුණු ජීවිතයට ඇතුල්වීමේ පියවර විස්තර කර තිබීම.

(2) මුල් ගෝලයන් - ගෙනසරත් විල අසල මාළු බාමින් සිටින විට ජේසුතුමා පැමිණීම, ජේසුතුමාට පේදුරු කීකරු වීම, පේදුරු ජාකොබ් ජොහාන් ජේසුතුමා අනුගාමී වීම විස්තර කර තිබීම.

(3) කමාව දීම - ස්වාමින් වහන්සේ කමාව දීම පිළිබඳ ඉගැන්වීම කමාවීමේ වටිනාකම් විස්තර කර තිබීම.

(4) පේදුරුගේ අවලාපය - ජේසුස්වහන්සේ විනිශ්චයට ගෙනයන අවස්ථාවේ ජේසුතුමා සමග මරණයට වුවද සූදානමින් පේදුරු එතුමා නාදුන බව ප්‍රකාශ කිරීම අවස්ථාව විස්තර කර තිබීම.